දුරකථන
தொலைபேசி
Telephones
011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary
011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax
011-2876169
011-2876181

විද්‍යුත් තැපැල
மின் - அஞ்சல்
E - mail
info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website
www.psc.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

මගේ අංකය / எனது இல. / My No. PSC/APL/14/79/2023

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2024.04.02

ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

**2024 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනාවලට අදාළ තීරණ දැනුම් දීම - ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවය**

අධ්‍යාපන අමාත්‍යාංශයට අනුයුක්තව සේවය කරනු ලබන ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ නිලධාරීන්ගේ 2024 වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සලකා බැලීමෙන් පසු රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබාදුන් තීරණ www.psc.gov.lk දරණ රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ පළ කර ඇත.

02) ඒ අනුව එකී ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් අදාල නිලධාරීන් දැනුවත් කරන ලෙස මෙයින් දන්වමි.

03) එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් වෙන වෙනම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ දන්වා එවීමක් සිදු නොකෙරෙන අතර, අදාල තීරණ රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ ස්ථාන මාරු අභියාචනයන්ට අදාළ නියෝග ප්‍රසිද්ධ කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන බව දන්වා සිටිමි. මේ සම්බන්ධයෙන් 2006 අංක 19 දරණ ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 2 (ඇ) සහ (ඈ), 3 සහ 4 යන වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

04) රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණයකින් අතෘප්තියට පත්වන රජයේ නිලධරයකුට 2002 අංක 04 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය පනතේ විධිවිධානවලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේය. එසේ වුවද, ඉදිරිපත් කරනු ලබන අභියාචනා සඳහා පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරයේ අවසන් තීරණයක් ලැබෙන තෙක් නොසිට ලබා දී ඇති ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක විය යුතු බවද කාරුණිකව දැනුම් දෙමි.

05) එසේම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ලබා දී ඇති ස්ථාන මාරු සම්බන්ධව ඉදිරියේදී ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හෝ නිර්දේශ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නැවත සලකා නොබලන බව දන්වන අතර එවැනි ඉල්ලීම් හා නිර්දේශ තවදුරටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකරන ලෙසද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

Mdaya

**ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න**
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ වාර්ෂික ස්ථාන මාරු අභියාචනා - 2024

රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණ

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර | වර්තමාන සේවා ස්ථානය | ස්ථාන මාරු කරන ලද සේවා ස්ථානය | රා.සේ.කො. තීරණය |
|---|---|---|---|---|---|
| 1 | කේ.කේ.එන් මැග්නස් මහතා | උපදේශක | බලපිටිය කාර්මික විද්‍යාලය | - | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම සහ 2025 වාර්ෂික ස්ථාන මාරු වලදී අභියාචක වෙත ප්‍රමුඛතාවය ලබා දෙන ලෙස අධ්‍යක්ෂ ජනරාල් වෙත දැන්වීම. |
| 2 | ඩී.කේ.සී. කුමාර මහතා | උපදේශක | දඹුල්ල කාර්මික විද්‍යාලය | අනුරාධපුර තාක්ෂණ විද්‍යාලය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම ( 2024 අධ්‍යන වර්ෂය අවසානයේදී ස්ථාන මාරුව ක්‍රියාත්මක කිරීම) |

Kushe

2/4/2024